ශ්‍රී ලංකා විවෘත විශ්වවිද්‍යාලය

අධ්‍යාපන පීඨය

අධ්‍යාපනවේදී (විශේෂ අවශ්‍යතා අධ්‍යාපන)ගෞරව උපාධි වැඩසටහන
5 වන මට්ටම-2020/2021

අවසාන පරීක්ෂණය - 2021

විශේෂිත තත්ත්වයන් සහ ඉගෙනුම් අවශ්‍යතා පිළිබඳ හැඳින්වීම - SNU5338 /ESU3138

කාලය පැය තුනයි. (03)

---

දිනය - 2021.08.01 වේලාව - ප.ව.01.30 - ප.ව.04.30 දක්වා

---

1 වන කොටසේ සියළුම ප්‍රශ්නවලට ද, 2 වන කොටසේ ඕනෑම ප්‍රශ්න තුනකට (03) ද පිළිතුරු සපයන්න.

<u>1 වන කොටස</u>

01. පොදු දෘෂ්ටි ඌනතා වර්ග පහක් (05) ලයිස්තු ගත කරන්න.

02. ඇසීමේ පොදු දෝෂ වර්ග හතරක් (04) නම් කර ඉන් එකක් (01) කෙටියෙන් උදාහරණ සහිතව පැහැදිලි කරන්න.

03. කථන හා භාෂා අක්‍රමතාව යනු කුමක්දැයි ඔබේ වචනයෙන් නිර්වචනය කරන්න.

04. ක්ෂුද්‍ර කපාලතාවයේ පොදු රෝග ලක්ෂණ පහක් (05) නම් කරන්න.

05. මාංශපේෂි පරිහානිය වර්ග හතරක් (04) කෙටියෙන් පැහැදිලි කරන්න.

06. 2002 මානසික ඌන වර්ධනය පිළිබඳ ඇමරිකානු සංගමය විසින් ඉදිරිපත් කර ඇති මානසික ඌන වර්ධනය පිළිබඳ නිර්වචනය දක්වන්න.

07. ඔටිසම් පරාසීය අක්‍රමතාවයේ සුලබ ලක්ෂණ පහක් (05) පැහැදිලි කරන්න.

08. ඩිස්ලෙක්සියා සහිත දරුවෙකු තුල දැකිය හැකි ලක්ෂණ පහක් (05) නම් කරන්න.

(ලකුණු 05 x 08 = 40)

## 2 වන කොටස

09. (I) ආබාධිත ළමුන් සඳහා ඇමරිකා ජාතික ව්‍යාප්ති මධ්‍යස්ථානය විසින් දක්වා ඇති පෙනීමේ දුර්වලතා ඇති සිසුන් විස්තර කිරීමට භාවිත කරන යෙදුම් හතර **(04)** කෙටියෙන් පැහැදිලි කරන්න. (ලකුණු 2 x 4 = 08)

(II) ඔබ අන්තර්කරණ පන්ති කාමරයක සේවයේ නියුතු ගුරුවරයෙකු ලෙස හීන දෘෂ්ටික ළමුන්ට පන්ති කාමර සහය සඳහා යොදා ගන්නා ක්‍රමෝපායන් පහක් **(05)** සුදුසු උදාහරණ උපුටා දක්වමින් පැහැදිලි කරන්න. (ලකුණු 12 )

10. (I) ළමුන් තුළ මස්තිෂ්කාඝාතය ඇතිවීමට බලපාන හේතු හතරක් **(04)** පැහැදිලි කරන්න. (ලකුණු 08 )

(II) මස්තිෂ්කාඝාත සහිත සිසුන් තුල දැකිය හැකි චාලක ගැටලු වර්ග පහක් **(05)**ක් නම් කර, එම චාලක ගැටලු මග හැරවීමට ඔබට කළහැකි යෝජනා උදාහරණ සහිතව දක්වන්න. (ලකුණු 12 )

11. (I) බුද්ධිමය ඌනතා සහිත ළමයින්ගේ අනුවර්ති චර්යා මැනීමට වැදගත්වන කුසලතා මොනවාදැයි විස්තර කරන්න. (ලකුණු 08 )

(II) ගුරුවරයෙක් ලෙස අධ්‍යාපනය කළහැකි (Educable) බුද්ධිමය ඌනතා සහිත ළමයෙකුගේ ඉගෙනුම සාර්ථක කිරීමට ඔබට සහය දැක්විය හැකි ආකාරය උදාහරණ හතරක් **(04)** ඇසුරෙන් පැහැදිලි කරන්න. (ලකුණු 12 )

12. (I) ඩිස්ග්‍රාෆියා යනු කුමක්දැයි පැහැදිලි කර, ඩිස්ග්‍රාෆියා සහිත දරුවන් තුලින් දිස්වන ගති ලක්ෂණ හතරක් **(04)** පැහැදිලි කරන්න. (ලකුණු 08 )

(II) ඩිස්ග්‍රාෆියා සහිත සිසුන් තක්සේරුකළ හැකි ක්‍රම පහක් **(05)** යෝජනා කරන්න. (ලකුණු 12 )

13. (I) ඌන අවධාන අධික්‍රියාකාරී දරුවන් (ADHD) තුළ ඔබට දක්නට ලැබෙන ගති ලක්ෂණ හතරක් (04) පැහැදිලි කරන්න. (ලකුණු 08 )

(II) ඌන අවධාන අධික්‍රියාකාරී දරුවන්ගේ හැසිරීම ඔබ අන්තර්කරණ පන්ති කාමර පරිසරයක් තුළ කළමනාකරණය කරන ආකාරය සුදුසු උදාහරණ හතරක් (04) ඇසුරෙන් පැහැදිලි කරන්න. (ලකුණු 12 )

14. (I) 'සුහග' සහ 'සහජ දක්ෂතා' යන යෙදුම ඔබේ වචනයෙන් නිර්වචනය කරන්න. (ලකුණු 08 )

(II) a) සුහග සහ සහජ දක්ෂතා ඇති දරුවන් පන්ති කාමරය තුළදී මුහුණදෙන සමාජ හා චිත්තවේගී ගැටලු තුනක් (03) පැහැදිලි කරන්න.

b) ඉහත ගැටලු මගහරවා ගැනීමට ඔබගේ යෝජනා ඉදිරිපත් කරන්න.

( ලකුණු 2 x 6 = 12)

හිමිකම් ඇවිරිණි.